මාධ්‍ය නිවේදන අංක 10

මැතිවරණ කොමිෂන් සභාව

**2021.03.30 දින රැස් වූ මැතිවරණ කොමිෂන් සභාව මතු දැක්වෙන තීරණ ගෙන ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.**

- ඉදිරියේ දී පැවැත්වීමට නියමිත ඡන්ද විමසීම් ඉලක්ක කොට ගෙන මැතිවරණ පැමිණිලි කළමනාකරණ ඒකකවල රාජකාරී සඳහා අනුයුක්ත කිරීමට අපේක්ෂිත රාජ්‍ය නිලධාරීන්, පොලිස් නිලධාරීන්, මැතිවරණ නිරීක්ෂණ සංවිධාන නියෝජිතයන් සඳහා සියළුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි පුහුණු වැඩමුළු 2021 අප්‍රේල් අවසන් සතියේ දී ආරම්භ කොට යම් නිශ්චිත කාල සීමාවක දී අවසන් කිරීම.

- පිළිගත් දේශපාලන පක්ෂ විසින් 2019 වර්ෂයට අදාළව මැතිවරණ කොමිෂන් සභාව වෙත ලබා දිය යුතු විගණනය කරන ලද ගිණුම් වාර්තා ලබා නොදුන් දේශපාලන පක්ෂ 04 ක් මේ වන විට හඳුනාගෙන ඇත. එම දේශපාලන පක්ෂ 2021 අප්‍රේල් මස 22 දිනට අදාළ වාර්තා ද සමඟ මැතිවරණ කොමිෂන් සභාවට කැඳවීමත් එදිනට එම වාර්තා ලබා දීමට අපොහොසත් වුවහොත් එකී පක්ෂ පිළිගැනීම අත්හිටුවීම.

- දැනට ලියාපදිංචි කොට ඇති පිළිගත් දේශපාලන පක්ෂවල නිල නාම ආගමික හෝ වාර්ගික වශයෙන් නම් කොට තිබේ ද යන්න සහ එම පක්ෂවල ව්‍යවස්ථාවලට ද එවැනි වගන්ති ඇතුළත් වී තිබේ ද යන්න පරීක්ෂා කොට බලා වාර්තා කිරීම පිණිස අතිරේක මැතිවරණ කොමසාරිස්වරයකුගේ ප්‍රධානත්වය සහිත නිලධාරීන් 05 දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් පත් කිරීම හා එම කාර්යයන් අධීක්ෂණය කිරීම සඳහා කොමිෂන් සභාවේ සාමාජිකයෙකු, මැතිවරණ කොමසාරිස් ජනරාල් හා ලේකම්වරයා පත්කිරීම.

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්

මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.
2021.03.30